## පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ජාතික පාසල් වෙත ස්ථාන මාරු කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් කැඳවීම

1. අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කර ඇති මාර්ගගත අයදුම්පත් මඟින් පමණක් ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්යය වේ.

2. මාර්ගගත අයදුම්පතට පිවිසීම සඳහා https://nspt.moe.gov.lk දිගුව භාවිත කරන්න.

3. මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා අදාළ උපදෙස් සංග්‍රහය https://nspt.moe.gov.lk දිගුව තුළ ද දක්වා ඇත.

4. අයදුම්පත් යොමුකළ හැකි කාලසීමාව 2026.07.02 දින සිට 2026.07.31 දින දක්වා වේ. අයදුම්පත්‍රය ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පිරවිය යුතුය.

5. මාර්ගගතව සම්පූර්ණ කරන ලද ස්ථාන මාරු අයදුම්පතෙහි මුද්‍රිත පිටපත නිවැරදිව පාසලේ ස්ථිර විදුහල්පති, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ හා අනුමැතිය සහිතව සහතික කර Scan කිරීමෙන් පසු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මාර්ගගත පද්ධතියට Upload කළ යුතු වේ. ඉහත පරිදි අයදුම්පතෙහි සහතික කරන ලද පිටපත් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර (2026.07.31) අදාළ මාර්ගගත පද්ධතියට යොමු කිරීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව තම අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දීම ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වගකීම වනු ඇත. පුද්ගලිකව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවනු ලබන ස්ථාන මාරු අයදුම්පත් හා නිර්දේශ රහිත අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

6. බාහිර පාර්ශවයන්ගේ නිර්දේශ සහිත ලිපි අයදුම්පත්‍රයට ඇමිණීමෙන් වැළකී සිටින ලෙස දන්වා සිටින අතර, එසේ අමුණා එවීමෙන් විශේෂ වරප්‍රසාදයක් හිමිනොවන බවද සැලකිය යුතුය.

7. අයදුම්පත්‍රය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසු එවන කිසිඳු ඇමුණුමක් භාර ගනු නොලැබේ. අතිරේක ලිපි ලේඛන අමාත්‍යාංශය වෙත වරින් වර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් විසින් සිදු නොකළ යුතුය.

- අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කිරීම හා මුද්‍රිත පිටපත නියමිත දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාර දීම නිලධාරීන්ගේ වගකීම වේ.
- භාර ගන්නා අයදුම්පත් සියල්ල නිලධාරීන් වෙත නිකුත් කර ඇති උපදෙස් මාලාවට අනුකූලව පාසලේ ස්ථිර විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව අදාළ උපලේඛන සමඟ නියමිත දිනට පෙර අදාළ මාර්ගගත පද්ධතියට උඩුගත කිරීම (Upload) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වගකීම වේ.
- පළාත් අධ්‍යාපන ලේකම් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශ සහ අනුමැතිය නියමිත දිනට පෙර අදාළ මාර්ගගත පද්ධතිය ඔස්සේ ලබා දිය යුතුය.

8. මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතී නම් principalbranchnew@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ 0112-784827 / 0112-786252 යන අංකවලට දැනුම්දිය හැක.